# අපේ අත් දැකීම් . . .

ශ්‍රී ලංකාවට සත්ව ප්‍රෝටීන් නිපැයුම අති විශාල ලෙස අවශ්‍ය වන මේ යුගයේදී එහි පුරෝගාමීන් පිරිසක් වන, කුකුලන් ඇති කරන්නන් කිහිප දෙනෙක් සමග සාකච්ඡා කිරීම වැදගත්ය.

මීගමුවෙන් සැතපුම් 16 ක් ඈත මිනුවන්ගොඩ, මැදගම්පිටියේ වික්ටර් බාලසූරිය මට පළමුවෙන් හමුවිය. වයස අවුරුදු 28 ක තරුණයෙක්වූ ඔහු වෘත්තියක් වශයෙන් කුකුලන්



කුකුල් පැටවු,

කෑම හා

බෙහෙත් ද්‍රව්‍ය

මිල ඉහල

නැගලා, ඒ

වුනත් කෙනෙ

කුට කුකුල්

පාලනයෙන්

ලාභ ලැබිය

හැකියි.

ඇති කිරීම අවුරුදු 6 ක් තිස්සේ කරගන එන ඇ: පො: සා: (සා; පෙ;) සමත් අයෙකි. තමා කුකුල් පාලනයට යොමුවූ ආකාරය විස්තර කරන ඔහු......

"අපේ ගමේ තරුණ පිරිසක් එක් වී 1972 අවුරුද්දේදී තරුණ ගොවි සංවිධානයක් ආරම්භ කළා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන්, මෙහි වර්ෂ ගණනාවක් තිස්සේ කුඩා කහ ගොවිපලක් පවත්වා ගෙන ගියත්, ආර්ථික වශයෙන් එතරම් ලාබදයක වූනේ නැහැ. කෙසේ වුවත් අපේ ව්‍යාපාරය තුලින් ගමේ තරුණ පිරිස එක බැම්මකට බැඳ තැබීමට හැකිවුනා. මෙ නිසාම 1975 දී එවකට සිටි උප දිසාපති වරයා අපේ සංවිධානයේ වැඩ අගය කරලා, මහජන බැංකුවෙන් අත්හද බැලීමේ පද නමින් රුපියල් 22000/- ක ණයක් ලබාදීමට කටයුතු කළා. ඒ මුදල තරුණයින් 11 ක් අතර බෙද හැරියා. සුදුසු ව්‍යාපෘති ආරම්භ කර ගැනීමට. එයින් එක් කෙනෙක් මල් වගාව තෝරාගත් අතිත් 10 ම කුකුලන් ඇති කිරීම තෝරා ගත්තා.

ඔබ කුකුලන් ඇති කිරීම තෝරා ගත්තේ ඇයි? මම අතුරු ප්‍රශ්නයක් නැගිමි. "මූලික වශයෙන් කරුණු 2 නිසා මෙය තෝරා ගත්තේ. සුලු ඉඩමකින්, ව්‍යාපාරය පටන් ගත හැකියි. මාස 6 ක් තුළ ආදායම් ලබාගත හැකියි. මේ නිසා රැකියා හිඟයෙන් දුක් වින්ද අපට තෝරා ගතයුතු හොඳම මාර්ගය එය බව හැඟී ගියා. හැරත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මහජන බැංකුවත් අපව ඒ පැත්තට යොමු කළා."

ගොවිපල ආරම්භ කළ ආකාරය තව දුරටත් ඔහු විස්තර කළා." අපි පළමුකොට කිකිලි පැටවුන් 100 බැගින් ඇති කිරීමට සුදුසු 30' X 15' ගෙවල් 10 ක් ඉදිකළා. මෙතනදී කුලී ශ්‍රමය වෙනුවට අපි කවුරුත් අත්කමට වගේ වැඩ කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගත්තා. ඒ 'හැරත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තරුණ ගොවි සමාජවලට 20% ක අඩු කල මිළට කිකිල් පැටවුන් සැපයවා, මේ නිසා රුපියල් 2000/- මුදලින් පැටවුන් 100 ක් මිළට ගෙන මාස 6 ක් රැක බලා නඩත්තු කරන්න එතරම් අපහසුවුනේ නැහැ"

ඔබට කුකුලන් ඇති කිරීම ගැන මූලික දැනීමක් තිබුනාද? "ඇත්තෙන්ම නැහැ. මම මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්නට පෙර කුකුල් පැටියෙක් අතින් අල්ලාවත් නැහැ. විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාව අතරේ බියක් තියනවා ඉන්කියුබේටරයකින් (බිත්තර රකින යන්ත්‍රයකින්) බිහිවන පැටව් ජීවත් කරවන්න ගොඩක් අමාරුයි කියලා ඒක වැරදි මතයක්. උදහරණයක් හැටියට මං මුලින්ම ඇතිකල පැටවු තොගයෙන් සියයට අනූනවයක්ම හරිගියා. කුකුල් පැටවු ඇති කිරීම ගැන පොතෙන් උපදෙස් අරන් විතරක් කටයුතු කරන්න බැහැ. භාවිතාව තුළින්ම අත් දැකීමෙන්ම තමයි අවබෝධයක් ලබන්න ඕනේ."

අද වෙළෙඳ පළ මිල අනුව, කුකුල් පැටවුන් 100 ක් ඇති කිරීමට රුපියල් 5000/- ක පමණ වියදමක් දරන්න වෙනවා. විශේෂයෙන්ම කුකුල් පැටවු, කෑම, සහ බෙහෙත් ද්‍රව්‍යවල මිළ ඉහල නැගලා ඒ වුනත් තමන්ගේ ශ්‍රමය සැලකිය යුතු ප්‍රමාණයකින් යොදන කෙනෙකුට කුකුල් පාලනයෙන් ලාබ ලබන්න බැරිකමක් නැහැ"